# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1779/17 - 2012 ඔක්තෝබර් මස 10 වැනි බදාදා - 2012.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 140, 141 සහ 164 වැනි වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් 2012 ජුනි මස 22 වැනි සිකුරාදා අංක 1763/26 දරන නියෝගයේ හතරවන ඡේදය පහත සඳහන් පරිදි ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

කුමාර වෙල්ගම,<br>
ප්‍රවාහන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 12 වැනි දින,<br>
කොළඹ දී ය.

4. මෙම නියෝග අදාලවන්නා වූ ඉදිකරන ලද සහ ඉදිනොකරන ලද ප්‍රදේශවල මාර්ග කොටස් ඔස්සේ මෙම නියෝගවල නිශ්චිතව දැක්වෙන වේග සීමා සංඥා ස්වරූපයෙන් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය. එසේ සවිකරන ලද සංඥා 1987 මාර්තු මස 13 වැනි දින අංක 444/18 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද මෝටර් රථවාහන (මාර්ග සලකුණු, සංඥා, සංකේත සහ මාර්ග සලකුණු කිරීම්) නියමයන් හි අන්තර්ගත රථ වාහන සංඥාවල නිශ්චිතව දක්වා ඇති සියලු විස්තරවලට අනුකූල විය යුතු අතර එකී නියෝගය පරිච්ඡින්න කර ඇති අවස්ථාවකදී, ඒ වෙනුවට ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු වෙනත් යම් නියෝගයකට අනුකූල විය යුතුය.

10 - 1073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 16731— 835 (2012/10)